IRDCRP

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) සංරචකය 1.3

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (EOI – 2026/YW1)

## තිරසර, ශක්තිමත් ග්‍රාමීය ආර්ථිකයක් ගොඩනැගීමට එක්ව කටයුතු කරමු.

ලෝක බැංකු සමූහයේ මූලාරම්භය සහිත “**Agriconnect**” සමග සහයෝගීතාව

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය (MOALLI), ලෝක බැංකු සමූහයේ සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක කරනු ලබන, ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP) මගින් නවෝත්පාදන ව්‍යාපාර අදහස් ඇති කාන්තාවන්, යෞවනයින්, ආබාධිත පුද්ගලයින් සහ ආර්ථික කටයුතු වල අවම නියෝජනයක් ඇති කණ්ඩායම්වල පුද්ගලයින් සඳහා අගය දාම ආයෝජන, වාණිජ හා අපනයන අරමුණු කරගත් කෘෂි ව්‍යාපාර සහ අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම් මත පදනම්ව කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ, පෞද්ගලික අංශයේ දායකත්වය ශක්තිමත් කිරීම සඳහා යෞවන ව්‍යාපාරිකත්ව වැඩසටහන වෙත ව්‍යාපාරික අවස්ථා සඳහා සලකා බැලීම පිණිස ව්‍යාපෘතියේ උප-සංරචක 1.3 යටතේ අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කෙරේ.

ආර්ථික ප්‍රතිපත්ති හා ග්‍රාමීය සෞභාග්‍යය සඳහා වන රජයේ උපාය මාර්ගවල වැදගත් කොටසක් ලෙස නවීන හා වාණිජ්‍යමය වශයෙන් විවිධාංගීකරණය වූ කෘෂි - ආහාර පද්ධති සංවර්ධනය සැලකේ. ඒ අනුව IRDCRP ව්‍යාපෘතිය විසින්, තිරසර කෘෂි ආහාර පද්ධති, දේශගුණ සුහුරු කෘෂිකර්මය, කාර්යක්ෂම ජල කළමනාකරණය හා වැඩි දියුණු කළ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය ප්‍රවර්ධනය කරනු ලබයි.

### යෞවන හා කාන්තා ව්‍යාපාරිකයන් සවි බල ගැන්වීම

ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතියේ (IRDCRP) උප-සංරචක 1.3 මගින් මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන සීමාකාරී සාධකයන් වන දැරිය හැකි, විශ්වාසනීය සහ දේශගුණික සුහුරු-කෘෂිකර්ම තාක්ෂණ හා සේවා ලබා ගත හැකි වනසේ කෘෂිකාර්මික අගය දාමවල යෞවන හා කාන්තා නායකත්වය යටතේ ඇති ව්‍යාපාරික ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දෙමින් කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශයේ දායකත්වය ශක්තිමත් කිරීම අරමුණු කරයි. මෙම සීමාවන් නිරාකරණය කිරීමෙන් ක්ෂේත්‍රයේ ඵලදායීතාව ය වැඩි කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම, වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය රැකියා උත්පාදන හැකියාව වැඩි කිරීමට හැකි වන අතර එමගින් ආදායම් වැඩි කිරීම සහ දේශගුණික හා ආර්ථික කම්පනවලට මුහුණ දීමේ හැකියාව වැඩි කරනු ඇත.

ආයෝජනයට සුදුසු (Bankable) අගය දාම ආයෝජන හඳුනාගෙන පිරිවැය-බෙදාගැනීමේ ක්‍රමයක් (Cost-sharing arrangement) යටතේ මූල්‍ය සහාය ලබා දෙනු ඇත. එහිදී ආයෝජන පිරිවැයෙන් කොටසක් IRDCRP ව්‍යාපෘතිය මගින් ආයෝජන ප්‍රේරණයක් (Catalytic investment) ලෙස ලබා දෙන අතර, ඉතිරි පිරිවැය ප්‍රතිලාභීන්ගේ දායකත්වයෙන් සහ වාණිජ බැංකුවකින් ලබාගන්නා ණයක් මගින් සපුරා ගත යුතුය.

### අදාළ ආකාර (Windows) වල මූලයම පරාමිතීන්

මෙම ව්‍යාපෘතිය මගින් කෘෂි ව්‍යාපාර ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශයේ දායකත්වය වැඩිදියුණු කිරීම සඳහා කාර්යයන් (works), භාණ්ඩ (goods) සහ සේවා (services) සඳහා සහාය ලබා දෙනු ඇත. එහිදී විශේෂයෙන්ම අගය දාමයට අයත් කාන්තාවන් සහ යෞවනයින් සඳහා ව්‍යාපාරික අවස්ථා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත.

| විස්තරය | | ආකාර 1 | ආකාර 2 |
|---|---|---|---|
| අවම මුළු ආයෝජනය | | Rs. 2,000,000 to Rs. 6,000,000 | Rs. 6,000,000 හෝ ඊට වඩා වැඩි |
| IRDCRP වෙතින් ආයෝජන සහාය | | 50% හෝ උපරිම Rs.2,000,000 දක්වා | 35% හෝ උපරිම Rs. 3,500,000 දක්වා |
| ප්‍රතිලාභී දායකත්වය හෝ මූල්‍ය ආයතන ණය | | 50% (අවම) | 65% |
| වයස් සීමාවන් | යෞවනයන් | අවුරුදු 18 - 40 | අවුරුදු 18 - 40 |
| | කාන්තාවන් | අවුරුදු 18 - 50 | අවුරුදු 18 – 50 |

### සුදුසුකම්ලත් අංශ

කෘෂිකර්ම, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජීවී, කුළුබඩු, වැවිලි භෝග

### අයදුම්කරන පිළිවෙළ

උනන්දුවක් දක්වන කෘෂි ව්‍යවසායකයින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ www.agrimin.gov.lk හි Documents ⟶ forms (https://agrimin.gov.lk/downloads/forms) හා එම වෙබ් අඩවියේ “Read Our Latest Insights” හි ඇතුළත් කර ඇති ආකෘතියට අනුව (Component 1.3 – Youth & Women Entrepreneurs) අභිලාෂය ප්‍රකාශ කිරීමේ අයදුම්පත (EOI ) සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

අදාළ EOI බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ “EOI 2026/YW1” ලෙස පැහැදිලිව සටහන් කරන්න. EOI භාරගනු ලබන අවසන් දිනය, 2026 මැයි 15 දින වේ. (වැඩි විස්තර සඳහා ඉහත වෙබ් සබැඳියේ මාර්ග නිර්දේශ වෙත යොමුවන්න)

### තෝරා ගැනීමේ ක්‍රමවේදය

අයදුම්කරුවන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සකසන ලද නිර්ණායකයන් මත තෝරා ගැනීම් සිදුකරන අතර, අදාළ තෝරා ගැනීම පළමුව පැමිණි අයහට පළමු ප්‍රමුඛතාව යන පදනමින් සිදු කෙරේ.

තෝරා ගත් අයදුම්කරුවන්, ව්‍යාපෘති සහාය අනුමැතිය ලැබීමට පෙර සම්මුඛ පරීක්ෂණ, ක්ෂේත්‍ර පරීක්ෂා හා සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා යොමු කරනු ඇත.

වැඩි විස්තර සඳහා කරුණාකර, දුරකථන අංක 0112 877 550 මගින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අමතන්න.


**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**

**ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය,**

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**

**123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**